# ශ්‍රී ලංකා වෛද්‍ය සභාව (SLMC)

## ඇබෑර්තු

## නීති නිලධාරී

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව (SLMC) විසින්, එම ආයතනයේ නීති ඒකකයේ ප්‍රධානියා වෙත නීති සහාය ලබාදීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**බඳවා ගැනීමේ ක්‍රමවේදය :**

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් පත් කරනු ලබන සුදුසුකම් ඇගයීම් පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයකදී, මෙම දැන්වීමෙහි නිර්දිෂ්ඨ සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් අතරින් ඉහළම ලකුණු ලබාගත් අය මෙම තනතුරට පත්කරනු ලැබේ. අදාළ සුදුසුකම් ඇගයුම් සම්මුඛ පරීක්ෂණ ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් අනුමත කළ ලකුණු ලබාදීමේ ක්‍රමවේදයට අනුකූලව පවත්වනු ලැබේ.

කාර්යයේ විෂය පථය සහ අභිප්‍රාය

නීති නිලධාරියා, ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ (SLMC) මූලික ක්‍රියාමාර්ග කමිටුවට අනුයුක්ත කරනු ලැබේ. ලියාපදිංචි වෘත්තිකයන්ට එරෙහිව පවත්වන මූලික පරීක්ෂණවලදී සහ කමිටු වාරතා සම්පාදනය කිරීමේදී ඔහු/ ඇය මූලික ක්‍රියාමාර්ග කමිටුවට සහයවීම අවශ්‍ය වේ.

**අවශ්‍ය සුදුසුකම්**

- නීතිඥවරයකු (AAL) වශයෙන් ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ දිවුරුම් දී සිටින අයකු විය යුතුය.
- ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ දිවුරුම් දීමෙන් පසුව වසර තුනකට (03) නොඅඩු අධිකරණ පළපුරුද්දක් තිබිය යුතුය.

**හෝ**

- ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු ලෙස දිවුරුම්දීමෙන් පසුව, රජයේ ආයතනයක නීති නිලධාරී තනතුරක * අවම වශයෙන් වසර තුනක (03) සේවා පළපුරුද්ද තිබිය යුතුය.

  * **නීති නිලධාරී තනතුරක් යනු මූලික බඳවා ගැනීමේ සුදුසුකම් ලෙස වන නීති උපාධියක් ලබා තිබීම හෝ නීතිඥවරයෙකු ලෙස දිවුරුම්දී තිබිය යුතු තනතුරක් වේ.**

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීති උපාධියක් (LLB) හෝ වෙනත් පශ්චාත් උපාධි සුදුසුකම් ලබාතිබීම අමතර සුදුසුකම් ලෙස සලකණු ලැබේ.

**භෞතික සුදුසුකම් :**

සෑම අයදුම්කරුවකුම අදාළ තනතුරෙහි කාර්යභාරය නිසි පරිදි ඉටු කිරීම සඳහා යහපත් මානසික හා ශාරීරික සුවණතාවයෙන් යුක්ත විය යුතුය.

**රාජකාරි සහ වගකීම් :**

- මූලික ක්‍රියාමාර්ග කමිටුව විසින් පවත්වනු ලබන සියලුම විමර්ශන සඳහා අනිවාර්ය සහභාගීත්වය.
- මූලික ක්‍රියාමාර්ග කමිටුවේ විමර්ශන පැවැත්වීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය සමග සහාය වීම.
- මූලික ක්‍රියාමාර්ග කමිටුවට ඔවුන්ගේ සාකච්ඡාවලදී සහය වීම.
- මූලික ක්‍රියාමාර්ග කමිටුවේ වාර්තා සම්පාදනය කිරීමට සහය වීම.
- මූලික ක්‍රියාමාර්ග කමිටුවේ සභාපතිවරයා විසින් නියම කොට පවරන ලද වෙනත් රාජකාරී සහ වගකීම්.

**සේවයේ යෙදවීමේ නියමයන් :**

- පත්වීම අර්ධකාලීන කොන්ත්‍රාත් පැවරුම් පදනම මත සිදුකෙරේ.

**වැටුප :** අදාළ ගෙවීම් වෛද්‍ය සභාව විසින් තීරණය කරනු ලැබේ.

**වයස :** අවුරුදු 60 හෝ ඊට අඩු

**අයදුම් කිරීමේ ක්‍රමවේදය :**

අයදුම්කරුවන් විසින්, තම සම්පූර්ණ ජීවදත්ත ඇතුළත්ව ආවරණ ලිපියක් (රජයේ ආයතනයක අයදුම්කරුවකු වෙතොත් අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් අයදුම්කරු අදාළ තනතුරට තෝරාගත හොත් දැනට දරනු ලබන තනතුරින් නිදහස් කළ හැකිද යන කරුණු සඳහන් කොට) සමග එහි ඔහු/ ඇය තනතුර දැරීමට ඇති සුදුසුකම් මතු කොට දක්වමින් අයදුම්පතක් **පහත සඳහන් ලිපිනය** වෙත 2025 ඔක්තෝබර් 21 දින හෝ ඊට පෙර ලැබීමට සැලැස්විය යුතුය. අදාළ අයදුම්පත් බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ "**නීති නිලධාරී තනතුරට බඳවා ගැනීම**" යනුවෙන් සඳහන් කොට ලියාපදිංචි තැපෑලෙන් හෝ ඊමේල් මගින්, වෛද්‍ය සභාවේ ලේඛකාධිකාරී වෙත එවිය යුතුය.

**සටහන :** තම අයදුම්පත්වල අසත්‍ය හෝ නිරවද්‍ය නොවන තොරතුරු සඳහන් කරනු ලබන අයදුම්කරුවන්ගේ අයදුම්පත්, පත්වීම සිදු කිරීමට පෙර සනාථ වුවහොත් ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කෙරෙනු ඇත. එවන් තොමග යවන සුළු කරුණු පත්වීම ලද පසුව හෙළි වුවහොත් අදාළ විනය ක්‍රියාපටිපාටින් ප්‍රකාරව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ඇත. මේ සම්බන්ධයෙන් ගනු ලබන අවසන් තීරණය වෛද්‍ය සභාව සතු වේ.

**ලේඛකාධිකාරී,**
**ශ්‍රී ලංකා වෛද්‍ය සභාව,**
**31, නොරිස් කැනල් පාර, කොළඹ 10.**
registrar@slmc.gov.lk
**2025 ඔක්තෝබර් 05**